කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව
කොළඹ දිස්ත්‍රික්කය
--------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 05 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 04 දින සභාවේ ලේකම්වරිය වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපැම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) පහත සඳහන් වටිනාකම් ගිණුම් ගතවී නොතිබුණි.

(i) සභාව සතු සියළුම ඉඩම් සහ ගොඩනැගිලිවල වටිනාකම,
**(ii)** රු.97,500 ක් වූ ගිණුම් පිළියෙල කිරීමේ ගාස්තු,
**(iii)** ප්‍රවර්තන වර්ෂය සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන

(ආ) රු.761,050 ක් වටිනා ආයුර්වේද ඖෂධ මිලදී ගැනීම් දෙවරක් ගිණුම්ගතවී තිබුණි.

(ඇ) එකතු කල අගය මත බදු රු.1,592,300 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට අදාලව ලැබූ වරිපනම් රු.8,338,941 ක් ඉදිරියට ගෙවූ වරිපනම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය ශේෂය රු.305,618 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබූ මුද්දර ගාස්තු රු.1,522,335 ක් සමුච්චිත අරමුදලට බැර කිරීම වෙනුවට ලැබිය යුතු මුද්දර ආදායම් ගිණුමට බැර කර තිබුණි.

(උ) ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු වටිනාකම රු.343,122 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) ප්‍රතිපූර්ණය නොකරන වැටුප් රු.20,771,523 ක් හා සභික දීමනා රු.630,000 ක්, ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

ගිණුම් විෂයයන් 11 කට අදාලව ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.355,773 ක් වූ අතර ඊට අදාල උපයෝගී ලේඛණ / වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.297,892,073 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම් විෂයයන් 02 කට හා ගෙවිය යුතු ගිණුම් විෂයකට අදාලව එකතුව රු.714,014 ක ශේෂයක් දීර්ඝ කාලයක් තිස්සේ නිරවුල් නොකර මූල්‍ය ප්‍රකාශයන්හි ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) රු.10,376,697 ක් වූ සේවක ණය ශේෂය තුල සේවය හැරගිය, සේවය අත්හිටවූ, ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය හා මිය ගිය සේවකයන් 13 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ වල එකතුව රු.412,924 ක් විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

-----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.56,315,059 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.89,048,114 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.109,999,705 ක් විය.

2.2 බැංකු ගිණුම්

---------------

2016 දෙසැම්බර් 31 දිනට සකස් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශයේ වසර 03 කට පෙර තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු.16,669 ක චෙක්පත් 03 ක්, තහවුරු කර නොගත් වටිනාකම රු.25,215 ක එකතු කිරීම් හා වටිනාකම රු.56,239 ක අඩුකිරීම් ගැලපුම් වශයෙන් දක්වා තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2016 | | | | 2015 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | 2016ජනවාරි හිඟ ශේෂය | බිල් කිරීම | තථ්‍ය අයකර ගැනීම | 2016 දෙසැ.31 දිනටසමුච්චිත හිඟය | 2015ජනවාරි හිඟ ශේෂය | බිල් කිරීම | තථ්‍ය අයකර ගැනීම | 2015 දෙසැ.31 දිනට සමුච්චිත හිඟය |
| | **රු.000** | **රු.000** | **රු.000** | **රු.000** | **රු.000** | **රු.000** | **රු.000** | **රු.000** |
| වරිපනම් බදු | 55,467,503 | 43,663,465 | 45,852,897 | 53,278,074 | 54,878,212 | 64,127,053 | 49,037,228 | 69,968,038 |
| බලපත්‍ර ගාස්තු | 242,715 | 666,060 | 357,710 | 551,065 | 485,430 | 617,860 | 626,960 | 476,330 |
| කුලී | 5,221,055 | 3,157,200 | 4,425,482 | 3,952,774 | 7,119,965 | 9,330,600 | 6,177,252 | 10,273,310 |
| ව්‍යාපාර බදු | 115,540 | 1,864,140 | 1,060,520 | 919,160 | 231,080 | 1,065,581 | 1,177,811 | 118,850 |

### 2.3.2 වරිපනම්

(අ) හිඟ වරිපනම් බදු වටිනාකම 2015 වර්ෂයට වඩා රු.10,729,292 ක අඩුවීමක් පෙන්නුම් කරන අතර එය 2015 වර්ෂයේ අවසාන දිනට පැවති රු.69,968,038 ක් වූ හිඟ ශේෂය ගණනය කිරීමේදී ඇති වූ වැරදි, නිවැරදි කිරීම සඳහා රු.12,222,967 ක ජ'නල් සටහනක් මගින් කල ගැලපීම නිසා සිදු වූවක් විය.

(ආ) 2016 වර්ෂයේදී වරිපනම් අයකර ගැනීම පෙර වර්ෂ හිඟ වටිනාකමින් සියයට 36 ක් හා ප්‍රවර්තන වර්ෂයේ වරිපනම් බිල් කිරීම් වලින් අයවීමේ ප්‍රතිශතය සියයට 59 ක් විය.

### 2.3.3 කඩකුලී

(අ) කොටිකාවත්ත පොදු වෙළඳ සංකීර්ණයේ පවතින කඩ බක්කි 28 න් සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති මුළු හිඟ කඩ කුලී වටිනාකම රු.904,460 ක් වූ අතර, ඒ අතරින් 2016 වර්ෂයට කිසිදු කුලී මුදලක් නොගෙවූ කඩ බක්කි 11 ක හිඟ කුලී වටිනාකම රු.623,450 ක් විය.

(ආ) කොටිකාවත්ත උපකාර්යාලය මගින් පාලනය වන අඹතලේ හංදියේ වෙළඳසැල් 12 කින් 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කුලිය රු.250,282 ක් හා දඩ කුලිය රු.20,380 ක් විය.

(ඇ) බාරොන් ජයතිලක උඩු මහල් වෙළඳසැල් දේශණ ශාලාව කුලියට ලබා දීමෙන් අයවිය යුතු සමුච්චිත හිඟ කුලී වටිනාකම වු රු.326,775 ක් අයකර ගැනීමට සභාව ක්‍රියාකර නොතිබුණි.

2.3.4 නිවාස කුලී
-------------
කොටිකාවත්ත නිවාස සංකීර්ණය හා කොටිකාවත්ත උඩු මහල් නිවාස සංකීර්ණයේ පිහිටි නිවාස 38 කින් අයවිය යුතු හිඟ නිවාස කුලී වටිනාකම රු.1,388,728 ක් වු අතර එම හිඟය මුළු හිඟ කුලී වටිනාකමින් සියයට 92 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------
3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා
------------------------------------
**3.1.1** 1993 නොවැම්බර් 18 දිනැති සැලසුම් චක්‍රලේඛ අංක 15 මගින් නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් බැංකු ගිණුමක් පවත්වා, ප්‍රමාණවත් මුදලක් එකතු වූ විට පළාත් පාලන ආයතන විසින් හදුනාගත් ව්‍යාපෘතියක් සඳහා ශක්‍යතා වාර්තාවක් සමඟ මුදල් ආපසු ගැනීම සඳහා අනුමැතිය පතමින්, සභාවට අවශ්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක කල හැකිව තිබුණද 2016 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ රු.1,950,704 ක් වර්ෂ ගණනාවක සිට නිශ්කාර්යව පැවතුනි.

3.1.2 නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්
-----------------------------------------

වටිනාකම රු.3,200,000 ක් වු අක්‍රිය වාහන 04 ක් අලුත්වැඩියා කිරීමට හා වටිනාකම රු.500,000 ක් වු නැවත අලුත්වැඩියා කල නොහැකි තත්වයේ පවතින ට්‍රැක්ටරය අපහරණය කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

3.1.3 හඳුනාගත් අලාභ
-------------------
සමාලෝචිත වර්ෂයේ සභා දේපළ සඳහා විදුලි බිල්පත් හා ජල බිල්පත් ගෙවීමේදී පිළිවෙලින් රු.8,177 ක් සහ රු.2,153 ක ප්‍රමාද ගාස්තුවක් ගෙවා තිබුණි**.**

3.1.4 කොන්ත්‍රාත් පාලනය
**--------------------**

විමධ්‍යගත අයවැය, ග්‍රාමීය යටිතල පහසුකම් හා පළාත් පාලන ආයතන යටිතල පහසුකම් නගා සිටුවීම හා සභා අරමුදල් ආදි විවිධ මූලා ප්‍රතිපාදන මගින් රු.62,185,831 ක පිරිවැය වු කර්මාන්ත 89 ක් අනුමත කර තිබු අතර ඉන් වටිනාකම රු.1,531,211 ක් වු කර්මාන්ත 02ක් අතහැර දමා තිබුණි.

3.1.5 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
----------------------------------
පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශයේ එකතු වන සියළු කසළ වලින් දිරන කසළ කොම්පොස්ට් නිෂ්පාදනයට යොදා ගන්නා බවත් හා නොදිරන කසළ බල ප්‍රදේශයේ පිහිටි වගුරු බිමකට මුදාහරිනු ලබන බවත් නිරීක්ෂණය විය.

(ආ) අංගනයේ කසළ තුනී කිරීම සඳහා කුලී පදනම මත ලබාගෙන තිබූ චේන් ඩෝසරය වෙනුවෙන් 2016 වර්ෂය තුල රු.5,674,032 ක් ගෙවා තිබූ අතර සභාවට එවැනි වාහනයක් මිලදී ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) 2008 ජූලි 30 දිනැති අංක 1560/6 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද බස්නාහිර පළාතේ 2008 අංක 01 දරන නාගරික අපද්‍රව්‍ය කළමනාකරණ රීති වල 6 වන පරිච්ඡේදයේ 59 වැනි ඡේදයේ පරිදි සෑම පළාත් පාලන ආයතනයක් විසින්ම අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ මැදිහත්වීම අනුව කාබනික අපද්‍රව්‍ය සඳහා ජීව වායුව කොම්පෝස්ට්කරණය හෝ වෙනත් ප්‍රායෝගික තාක්ෂණික ක්‍රම මගින් සංවිධානය කල යුතු අතර සභාව විසින් කොම්පොස්ට් අංගනයක් පවත්වාගෙන ගොස් තිබුනද එය සමස්ථ බලප්‍රදේශයේ දිරන කසළ කොම්පෝස්ට්කරණය සඳහා ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

(ඇ) නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ රීති හි 2වන පරිච්ඡේදයේ18 (1) වගන්තිය අනුව පළාත් පාලන ආයතනයට ගෙවනු ලබන බදුවලට අමතරව, කසළ දොරින් දොරට එකතු කිරීම වියදම් පියවා ගැනීම සඳහා ගෘහ මූලිකයන්ගෙන් ගාස්තුවක් අයකර නොතිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය
-----------------------------------------

4.1 අයවැය පාලනය
------------------

අයවැය හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ අතර අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4.2 ක්‍රියාකාරි සැලැස්ම
---------------------

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

4.3 ප්‍රසම්පාදන සැලැස්ම
----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) තොග පාලනය

(ඈ) ආදායම් පාලනය

(ඉ) කොන්ත්‍රාත් පාලනය

(ඊ) අභ්‍යන්තර විගණනය